**ගොවිජන සංවර්ධන අරමුදල - 2019**

**-----------------------------------------**

**1.1 අහිතකර මතය.**

**-----------------**

ගොවිජන සංවර්ධන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනෙන් දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේදක්වා ඇති කරුණුවලින් වන බලපෑම හේතුවෙන්, අරමුදලේ 2019දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ප්‍රමිතිවලටඅනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 අහිතකර මතය සඳහා පදනම.**

---------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව අහිතකර මතයක් ප්‍රකාශ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අහිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.**

**------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හාඅරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.**

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබැවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතවඋචිතවිගණනපටිපාටිසැලසුම්කිරීමපිණිසඅරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේඅඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

**1.5 මූල්‍ය ප්‍රකාශන.**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිති අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේදවල වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කරන මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගලපා සංසන්දනාත්මක අගයන් ප්‍රතිෂ්ඨාපනය කර, එම වැරදිවල ස්වභාවය හා ගලපන ලද ආකාරය පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුයි. එසේ වුවද ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී රු. 194,969,772 ක මූල්‍ය ප්‍රකාශනවල වැරදි නිවැරදි කිරීම් කර නැවත ප්‍රතිෂ්ඨාපනය කර තිබුණද ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අතපසුවීම් සිදුවීම වළක්වා ගැනීමට කටයුතු කරමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ප්‍රමිති අංක 1 හි 7 ඡේදය ප්‍රකාරව ආදායම් හා වත්කම් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතු අතර ගිණුම්කරණ සටහන් අංක 01 මඟින්ද උපචිත පදනම යොදාගන්නා බව දක්වා තිබුණද එයට පටහැනිව අක්කර බදු ආදායම සහ ට්‍රැක්ටර් ට්‍රේලර් ආදායම මුදල් පදනමට ගිණුම්ගත කර තිබුණි. | විගණන විමසුම වෙතින් අනාවරණය කර ඇති තොරතුරු තවදුරටත් අධ්‍යයනය කර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අත් ට්‍රැක්ටර් ණයගැතියෝ ලෙස ගැලපූ ශේෂය රු. 132,505,955 ක් විය. එසේ වුවද එම ශේෂයේ 2006 සිට 2012 වර්ෂය දක්වා ට්‍රැක්ටර් වාරික වැඩියෙන් ලැබුණු රු. 2,551,196 ක මුදල අඩුකිරීම හේතුවෙන් ණයගැති ශේෂය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. තවද, 2006 සිට 2012 වර්ෂවල වාරික ගෙවීම පැහැර හැරීම හේතුවෙන් අත්පත් කරගෙන තිබුණු ට්‍රැක්ටර්වල හිඟ වාරික මුදල රු.11,499,951 ක් ණයගැතියන්ගෙන් අඩුකිරීමට කටයුතු කර නොතිබුණි. | වාරික ගෙවීම නොගෙවීම හේතුවෙන් අත්පත් කර ගත් ට්‍රැක්ටර් නැවත විකිණීම හෝ අපහරණය කිරීමේ කටයුතු තවමත් අවසන්ව නොමැති බැවින් තවදුරටත් මෙම හිඟ මුදල ට්‍රැක්ටර් වාරික තුළ සටහන්ව ඇත. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු වීම. |

<table>
<tr><td>(ආ)</td><td>2010 වර්ෂයේ ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ ගොවීන් වෙත ණය පදනම මත ලබා දී තිබුණු ජල පොම්ප සඳහා 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 2,830,503 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි.</td><td rowspan="2">2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.</td><td rowspan="2">අයවිය යුතු ශේෂ ගිණුම්ගත කළ යුතු වීම.</td></tr>
<tr><td>(ඇ)</td><td>2012 වර්ෂයේ 2KR ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබා දී තිබුණු ට්‍රැක්ටර් සඳහා 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂය වූ රු. 16,020,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.</td></tr>
<tr><td>(ඈ)</td><td>සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන සහ අලෙවිසැල් ඉදිකිරීම හා අළුත්වැඩියා කටයුතු සඳහා සහ උපකරණ මිලදී ගැනීම සඳහා දරන ලද රු. 5,119,132 ක ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට වර්ෂයේ වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු. 511,913 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.</td><td>ඊට අදාළ ගැළපීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.</td><td>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ප්‍රාග්ධන වියදම් නිසි පරිදි හඳුනාගත යුතු වීම.</td></tr>
<tr><td>(ඉ)</td><td>ට්‍රැක්ටර් ට්‍රේලර් ණයගැතියන් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. 4,749,500 කශේෂයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අපහරණය කර තිබූ ට්‍රැක්ටර් ට්‍රේලර් වටිනාකම වූ රු. 1,378,500 ක් ණයගැතියන්ගෙන් අඩුකර නොතිබුණි.</td><td>2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.</td><td>අපහරණය කළ වත්කම් ණයගැතියන්ගෙන් අඩු කළ යුතු වීම.</td></tr>
<tr><td>(ඊ)</td><td>සමාලෝචිත වර්ෂයේ ගොවීන්ගෙන් අය කළ පෙර වර්ෂවලට අදාළ රු. 13,588,381 ක් වූ ට්‍රැක්ටර් ණය වාරික මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.</td><td>වර්ෂය තුළ උපලබ්ධි වූ ට්‍රැක්ටර් රථ වාරික ආදායම අරමුදලේ ආදායමක් ලෙස හඳුනාගන්නා බැවින් සමාලෝචිත වර්ෂයේ ගොවීන්ගෙන් අය කළ රු.13,588,381 ක් වූ ට්‍රැක්ටර් ණය වාරික මුදල වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරන ලදි.</td><td>එක් එක් වර්ෂයන්ට අදාළ ආදායම නිසි පරිදි හඳුනාගත යුතු වීම.</td></tr>
<tr><td>(උ)</td><td>2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අක්කර බදු ආදායම ගිණුම්වලට ගලපා නොතිබුණු අතර, පෙර වර්ෂවලට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 3,062,226 ක අක්කර බදු ආදායම පමණක් වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.</td><td>ඉදිරි වර්ෂයේදී මෙය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.</td><td>එක් එක් වර්ෂයන්ට අදාළ ආදායම නිසි පරිදි හඳුනාගත යුතු වීම.</td></tr>
</table>

| | | | |
|---|---|---|---|
| (ඌ) | පෙර වර්ෂවලට අදාළව ලැබුණු රු. 1,008,340 ක අවසරපත්‍ර ආදායම ගොවිජන සේවා මධ්‍යස්ථානවලට ආපසු ගෙවීමේදී ගෙවිය යුතු අවසරපත්‍ර ආදායම් ගිණුම ගලපනවා වෙනුවට සමාලෝචිත වර්ෂයේ අවසරපත්‍ර ආදායම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අරමුදලට අදාළ අවසරපත්‍ර ආදායම නිසි පරිදි හඳුනාගත යුතු වීම. |

**1.5.3 ලැබිය යුතු ගිණුම්.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථාන හා ගොවි සංවිධාන වෙත 2010 වර්ෂයේදී ලබාදී තිබුණු රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් හා රෝද 04 ට්‍රැක්ටර් ට්‍රේලර් සඳහා වර්ෂ 09 ක කාලයක සිට අයවිය යුතු රු. 4,816,075 ක මුදල සමාලෝචිත වර්ෂයේ 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දිස්ත්‍රික්කවලින් වාර්තා ලද පසු ඒවා අධ්‍යයනය කර හිඟ වාරික අයකරගැනීම හෝ අපහරණ කටයුතු සිදු කිරීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කිරීමට නියමිතය. | අයවිය යුතු ණය ශේෂ අයකර ගත යුතු වීම. |

**1.5.4 පැහැදිලි නොකළ වෙනස්කම්.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට අරමුදලේ පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 253,227,092 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව තැන්පත් ගිණුම් ශේෂය රු. 255,879,240 ක් විය. ඒ අනුව රු. 652,148 ක වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2008 වර්ෂයේදී දෙපාර්තමේන්තු ප්‍රධාන ගිණුම හා අරමුදලෙහි ගිණුම ඒකාබද්ධ කොට ඇත. එසේ ඒකාබද්ධ කිරීමට පෙර මෙම රු. 651,797 ක වෙනස ඇති වී ඇති අතර, මේ පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා පත් කර ඇති කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් 2019 මූල්‍යප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසු ලැබුණු අතර එය අධ්‍යයනය කර අවශ්‍ය ගැළපීම් 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් සිදු කිරීමට නියමිතය. | වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතු වීම. |
| (ආ) | එළදා වර්ධන හා අලෙවි අංශයේ වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේ අවසරපත්‍ර ගාස්තු හා ගොඩකිරීම් ආදායම රු. 9,258,440 ක් විය යුතු වුවත් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අවසරපත්‍ර ගාස්තු හා ගොඩකිරීම් ආදායම වශයෙන් රු. 6,680,005 ක් දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු. 2,578,434 ක් විය. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී අදාළ නිවැරදි කිරීම් සිදුකරන බවත් ඉදිරියේදී මෙම දෝෂයන් ඇතිවීම වැළැක්වීමට පියවර ගෙන ඇති බවත් කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ අංශවල උපලේඛන සමඟ සැසඳිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එළදා වර්ධන හා අලෙවි අංශයේ වාර්තා අනුව 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු සියයට 60 ක අවසරපත්‍ර ගාස්තුව රු. 18,705,804 ක් වුවත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ රු. 22,890,972 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව වෙනස රු. 4,185,167 ක් විය. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ අදාළ අංශවල උපලේඛන සමඟ සැසඳිය යුතු වීම. |
| (ඈ) | සේවා අංශයේ වාර්තා අනුව 2019 දෙසැම්බර් 31 දිනට ගොවිජන සංවර්ධන අරමුදලට ලැබුණු සියයට 20 ක අක්කර බදු ආදයම රු. 27,127,351 ක් වුවත් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සියයට 20 අක්කර බදු ආදායම රු. 27,493,983 ක් විය. ඒ අනුව වෙනස රු. 366,632 ක් විය. | | |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

| | නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| | (i) 56(1) උප වගන්තිය | යම් වර්ෂයක අක්කර බදු අය කිරීමේ කටයුතු එම වර්ෂයේම මාර්තු 31 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළ අක්කර බදු අය කිරීම 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි. | ඉදිරි වර්ෂය තුළදී අක්කර බදු අය කර ගැනීම හා අරමුදලේ 20% දායකය ප්‍රධාන කාර්යාලයට නියමිත දිනයට පෙර ගෙන්වා ගැනීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව අක්කර බදු අයකළ යුතු වීම. |
| | (ii) 97(3)උප වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ හා පසුගිය වර්ෂවලදී අරමුදලේ කර්තව්‍ය හා කාර්යයක් වූ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. | කෘෂිකාර්මික පර්යේෂණ සඳහා මානව සම්පත අප සතුව නොමැති බැවින් ඉදිරි වර්ෂයේ සිට ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වෙමි. | පනතේ අරමුණු ඉටු කිරීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2015 ජූලි 14 දිනැති 3/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිතමු.රෙ 371 (5) | චක්‍රලේඛ විධිවිධානවලින් බැහැරව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ නිලධාරීන් 11 ක් විසින් අවස්ථා 31 දී ලබාගෙන තිබුණු රු. 741,622 ක අත්තිකාරම් මුදල් දින 42 ක සිට දින 189 ක් අතර පරාසයක කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. | ලබාගත් අත්තිකාරම් පියවී නොමැති වීම නිසා සිදුවන අතපසුවීම් වළක්වා ගැනීම සඳහා DAD/FIN/PAY/3 අංක දරන 6/22/2020 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර ඇති අතර එහි සඳහන් කරුණු ඉතා තදින් ක්‍රියාත්මක කරන ලෙස අදාළ අංශ වලට උපදෙස් ලබා දී ඇත. | තත්කාර්ය අතුරු අග්‍රිම ප්‍රමාදයකින් තොරව පියවා ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ඇ) | 2014 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගොවිජන සංවර්ධන අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට ඉදිරියට ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අරමුදල වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වීම. |
| (ඈ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 1992 අගෝස්තු 03 දිනැති අංක 439/92 දරන චක්‍රලේඛය | යම්කිසි වර්ෂයක් තුළදී අයකර ගන්නා අක්කර බදු මුදලින් සියයට 20 ක දායකය එම වර්ෂයේම අප්‍රේල් 30 දිනට පෙර අරමුදලට බැර කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් අයකර ගත් අක්කර බදු මුදලින් රු. 687,049 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් බැර කර නොතිබුණි. | වර්ෂය තුළ අයකරගත් අක්කර බදු මුදලින් 20% දායකය දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස් ගිණුමට බැර කර ගෙන එම මුදල් කඩිනමින් ප්‍රධාන කාර්යාලයට යොමු කිරීමට සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියොජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත උපදෙස් ලබා දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අරමුදලේ ආදායම් අයකර ගත යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,793,421 කළඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ එය රු. 49,014,580 ක අතිරික්තයක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු. 52,808,001 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අක්කර බදු ආදායම රු. 3,048,306 කින් අඩුවීම, ට්‍රැක්ටර් හා ට්‍රේලර් ආදායම් රු. 13,561,184 කින් අඩුවීම, සැපයුම් වැඩිදියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ වියදම් රු. 3,809,671 කින් වැඩිවීම, නිලධාරීන් පුහුණු කිරීමේ වියදම් රු. 25,215,175 කින් වැඩිවීම, ස්ථාවර වත්කම් ක්ෂය රු. 1,400,059 කින් වැඩිවීම හා පොදු වියදම් රු. 8,166,423 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 කළමනාකරණ ක්‍රියාකාරකම්.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොවිජන අභිමන් වැඩසටහනක් පැවැත්වීම අරමුදලේ කාර්යයක් නොවූවද අරමුදලින් ඒ සඳහා රු. 7,314,096 ක් වැයකර තිබුණි. | "ගොවිජන අභිමන්" ජනාධිපති සම්මාන උළෙල සඳහා ගොවිජන සංවර්ධන අරමුදල මගින් වියදම් දරනු ලැබුවේ ගොවීන් හා නිලධාරීන් අභිප්‍රේරණය කිරීම සඳහා හා දෙපාර්තමේන්තු ආයතනික සංවර්ධනය ඇතිකිරීම උදෙසාත් බවත් සඳහන් කරමි. | පනතේ අරමුණු පමණක් ඉටු කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ආ) | 2006 වර්ෂයට පෙර හඳුනාගෙන තිබුණු රු. 450,000 ක තොග ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2006 වර්ෂයටත් පෙර සිට පැවත එන මෙම තොග ඌනතාවය පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර, අදාල නිර්දේශයන් ලැබීමෙන් පසු තොග ශේෂය නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසි පරීක්ෂණ කඩිනමින් සිදුකර අලාභ අයකර ගැනීමට ක්‍රියා කළ යුතු වීම. |
| (ඇ) | කුඹුරු ඉඩමක් නොවන බවට සහතික ලබා දීම හා කුඹුරු ඉඩමක් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට සහතික ලබා දීම සඳහා අයදුම්කරුවන් 03 කගෙන් 2018 සහ 2019 වර්ෂ තුළදී රු. 1,095,000 ක මුදලක් අරමුදල විසින් ලබාගෙන තිබුණද 2020 ජුනි 29 දින දක්වා අයදුම්කරුවන් වෙත අවසරපත්‍ර නිකුත් කර නොතිබුණි. | සේවා ගාස්තු ලබා ගැනීමෙන් පසු මහජන විරෝධතා සහ ගැටළු පැන නැගීඇති බැවින් මෙතෙක් බලපත්‍ර ලබා දී නොමැති අතර මුදල් ආපසු ඉල්ලා අයදුම්කරුවන් විසින් මෙතෙක් ඉල්ලීම්ද ඉදිරිපත් කර නැත. | අයදුම්කරුවන් ගෙන් බලපත්‍ර සඳහා මුදල් ලබාගෙන තිබුණු කාර්යයන් ප්‍රමාදයකින් තොරව බලපත්‍ර ලබාදිය යුතුය. එසේ නොමැති නම් අයදුම්කරුවන් ගේ මුදල් ආපසු ගෙවිය යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | 1989 සිට 2012 වර්ෂවල ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ බෙදා දුන් හිඟ වාරික ගෙවීම පැහැර හැරීම නිසා අත්පත් කරගත් රෝද 02 අත්ට්‍රැක්ටර් හා රෝද 04 ට්‍රැක්ටර් 70 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපහරණ කටයුතු අවසන් කර නොතිබුණි. | හිඟ වාරික පැහැර හැර ඇති ට්‍රැක්ටර් අපහරණය කිරීමට තක්සේරු කටයුතු සිදු කිරීම සඳහා මෝටර් රථ පරීක්ෂකගේ සහය ලබා ගැනීම අපහසු වූ බැවින් අපහරණය කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇත. | වත්කම්වල වටිනාකම ක්ෂය වීමට පෙර අපහරණ කටයුතු සිදු කළ යුතු වීම. |
| (ඉ) | ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ බෙදා දුන් රෝද 02 අත් ට්‍රැක්ටර් 1,174 ක්, රෝද 04 ට්‍රැක්ටර් 23 ක් හා රෝද 02 ට්‍රැක්ටර් ට්‍රේලර් 20 ක් සඳහා වාරික මුදල් ගෙවා අවසන් කර තිබුණදසමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාළ ගොවියන් වෙත පවරා දී නොතිබුණි. | මෙම ට්‍රැක්ටර් රථ බොහෝමයක ලියාපදිංචි අයිතිය පවතිනුයේ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් නමින් වන අතර තවත් ට්‍රැක්ටර් රථ 20ක පමණ පැවරුම් නිවේදන අත්සන් තැබීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මේ වන විට පවරාදීම් කටයුතු සිදු කිරීම සඳහා පැවරුම් නිවේදන 25 ක් පමණ ලැබී ඇත. | ණය වාරික ගෙවූ ගොවීන්ට වත්කම් පවරා දිය යුතු වීම. |